ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**Communications Department**

30, Janadhipathi Mawatha, Colombo 01, Sri Lanka.

Tel: 2477424, 2477423, 2477311

Fax: 2346257, 2477739

E-mail: dcommunications@cbsl.lk, communications@cbsl.lk

Web: www.cbsl.gov.lk

# Press Release

| | |
|---|---|
| **Issued By** | බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව |
| **Date** | 2020 ඔක්තෝබර් 23 |

**අයිසීඅයිසීඅයි බැංකුව (අයිසීඅයිසීඅයි බැංකුව කොළඹ ශාඛාව) වෙත නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම**

ඉන්දියාවේ අයිසීඅයිසීඅයි බැංකුව විසින් කරන ලද ඉල්ලීම සලකා බලා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1988 අංක 30 දරණ බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ අයිසීඅයිසීඅයි බැංකුවේ ව්‍යාපාර කටයුතු වසා දැමීමට සහ ඒ සඳහා නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීමට නියමයන් හා කොන්දේසි කිහිපයකට යටත්ව අනුමැතිය ලබා දී තිබේ.

අයිසීඅයිසීඅයි බැංකුව මුදල් මණ්ඩලය විසින් පනවන ලද නියමයන් හා කොන්දේසි වලට අනුකූල වීම පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂක සෑහීමකට පත්වීමෙන් පසු, බැංකු කටයුතු කරගෙන යාම සඳහා අයිසීඅයිසීඅයි බැංකුව වෙත නිකුත් කරන ලද බලපත්‍රය 2020 ඔක්තෝබර් 23 දින සිට අවලංගු කරන ලදී.